# SUGGESTED SOLUTIONS

## KE3 (B) – Fundamentals of Law

**සැප්තැම්බර් 2019**

NOT FOR SALE

All Rights Reserved

# **1** වන කොටස

**පිළිතුරු අංක 01**

1.1

| ඉගෙනුම් ප්‍රතිඵල: 1.3.1 |
|---|
| පිටු අංක: 8/17/21 |
| **නිවැරදි පිළිතුර: C** |

1.2

| ඉගෙනුම් ප්‍රතිඵල: 2.1.1 |
|---|
| පිටු අංක: 37 - 40 |
| **නිවැරදි පිළිතුර: C** |

1.3

| ඉගෙනුම් ප්‍රතිඵල: 2.5 |
|---|
| පිටු අංක: 69 - 71 |
| **නිවැරදි පිළිතුර: A** |

1.4

| ඉගෙනුම් ප්‍රතිඵල: 3.2.1 |
|---|
| පිටු අංක: 85 |
| **නිවැරදි පිළිතුර: B** |

1.5

| ඉගෙනුම් ප්‍රතිඵල: 4.1.1 |
|---|
| පිටු අංක: 102 |
| **නිවැරදි පිළිතුර: D** |

1.6

| ඉගෙනුම් ප්‍රතිඵල: 5.7.6 |
|---|
| පිටු අංක: 150/151 |
| **නිවැරදි පිළිතුර: C** |

1.7

| ඉගෙනුම් ප්‍රතිඵල: 7.2.1 |
|---|
| පිටු අංක: 216-218 |
| **නිවැරදි පිළිතුර: B** |

NOT FOR SALE

1.8

| ඉගෙනුම් ප්‍රතිඵල: 7.3 |
|---|
| පිටු අංක: 206-209 |
| **නිවැරදි පිළිතුර: C** |

1.9

| ඉගෙනුම් ප්‍රතිඵල: 7.1 |
|---|
| පිටු අංක: 209 - 214 |
| **නිවැරදි පිළිතුර: C** |

1.10

| ඉගෙනුම් ප්‍රතිඵල: 8.2.1 |
|---|
| පිටු අංක: 229/230/232/234/240 |
| **නිවැරදි පිළිතුර: A** |

**(2 x 10 = මුළු ලකුණු 20)**

NOT FOR SALE

# 2 වන කොටස

**පිළිතුර 02**

2.1

| ඉගෙනුම් ප්‍රතිඵල: 1.4.1 සහ 1.4.2 |
|---|
| පිටු අංක: 23 |

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ (SLAASMB) ප්‍රධාන කාර්යය පහත පරිදි වේ.

- විශේෂිත ව්‍යවසායන්හි ගිණුම් පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම සහ විගණනය කිරීම යන කටයුතු වල දී, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත හා ගිණුම් ප්‍රමිත පිළිපැද ඇත්ද යන්න අධීක්ෂණය කිරීම.

2.2

| ඉගෙනුම් ප්‍රතිඵල: 3.4.1 |
|---|
| පිටු අංක: 93 |

පහත සඳහන් අවස්ථා වලදී, මිල නොලත් විකුණුම්කරුවෙකුට එම භාණ්ඩ "සංක්‍රමණයේ දී" (stoppage in transitu) නැවැත්වීමේ අයිතිය ඇත.

- ගැණුම්කරු වස්තුභංගත්වයට පත් වී ඇති විට.
- භාණ්ඩ සංක්‍රමණයේ පවතී නම්.

2.3

| ඉගෙනුම් ප්‍රතිඵල: 4.3.1 |
|---|
| පිටු අංක: 108 |

විනිමය බිලක යථා කාලධාරකයෙකුගේ අයිතිවාසිකම් (1927 අංක 25 දරන විනිමය බිල් අඥා පනතේ 38 වගන්තියට අනුව) පහත පරිදි වේ.

A. ඔහුට ඔහුගේ නමින්ම බිල්පත මත නඩු පැවරිය හැක.
B. තම සියළු පූර්වගාමීන්ගේ හිමිකමෙහි පැවැති දෝෂ වලින් නිදහස්ව ඔහු බිල්පත දරයි.
C. සියළු දෙනාටම එරෙහිව මුදල් ගෙවීම බලාත්මක කිරීමට හැකි වන ආකාරයට ඔහු බිල්පත දරයි.
D. තම හිමිකමෙහි දෝෂ තිබුණ ද ඔහු බිල්පතට ගෙවීමක් ලබාගන්නේ නම්, නිසි පරිදි ගෙවන්නෙකුට වලංගු නිදහස් කිරීමක් ලැබේ.

NOT FOR SALE

2.4

| ඉගෙනුම් ප්‍රතිඵල: 5.3 |
|---|
| පිටු අංක: 132 සහ 133 |
| නියෝජිතයා, රහස් ලාභයක් ලබන්නේ, ප්‍රධානියාගේ කැමැත්ත නොමැතිව නම්, නියෝජ්‍යත්ව නීතිය යටතේ ප්‍රධානියාට ලබා ඇති අයිතිවාසිකම් යටතේ පහත දැක්වෙන දෑ කිරීමට හිමිකම ඇත.<br>A. නියෝජිතයාට ඔහුගේ කොමිස් මුදල හෝ වේතනය ගෙවීම ප්‍රතික්ෂේප කිරීම.<br>B. නියෝජිත ගිවිසුම අවලංගු කිරීම.<br>C. නියෝජිතයාගෙන් රහස්‍ය ලාභය අය කර ගැනීම.<br>D. නියෝජිතයා දැනුම්දීමකින් තොරව පහ කිරීම. |

2.5

| ඉගෙනුම් ප්‍රතිඵල: 8.2.1 (2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත) |
|---|
| පිටු අංක: 235 |
| 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත මගින්, හඳුනාගනු ලබන බුද්ධිමය දේපළ පහත පරිදි වේ.<br>• ප්‍රකාශන අයිතිය<br>• කාර්මික සැලසුම්<br>• පේටන්ට් බලපත්‍ර<br>• ලකුණු සහ වෙළඳ සලකුණු<br>• වෙළඳ නාම<br>• සංයුක්ත පරිපථයන් සඳහා ව පිරි සැලසුම් නිර්මාන<br>• භූගෝලීය දර්ශන |

**(2 x 5= මුළු ලකුණු 10)**

NOT FOR SALE

NOT FOR SALE

## 3 වන කොටස

**පිළිතුර 03**

(a)

| ඉගෙනුම් ප්‍රතිඵල: 2.2.2 |
|---|
| පිටු අංක: (සිංහල පිටු 52 සහ 53) |

මෙම, දෙන ලද සංසිද්ධියේ කරුණු අනුව සත්‍ය වශයෙන්ම වැරදි හඳුනාගැනීමක් මත K සම්පූර්ණයෙන්ම වෙනස් ස්වභාවයේ ගිවිසුමකට ඇතුලත් වී ඇත. මෙය ගිවිසුමේ ස්වභාවය පිළිබඳ වැරදීමක් ලෙස සැලකේ.

ලබාදී ඇති කරුණු අනුව, වැරදි ලේඛනයක් අත්සන් කිරීම සම්බන්ධව, K ගේ පාර්ශ්වයෙන් නොසැලකිලිමත්කමක් සිදුවී නොමැත. එම නිසා, එවැනි වැරදීමක් මත ඇතුලු වූ ගිවිසුමක් ශූන්‍ය වන අතර, "K" ට එයින් බැඳීමක් ඇති නොවේ.
දෙන ලද සංසිද්ධියට සමාන කරුණු පහත සඳහන් නඩුවේ දී සාකච්ඡා කරන ලදී.

නඩුවේ නම:

ෆොස්ටර් එදිරිව මැකිනන්
(Foster vs Mackinnon (1869) L.R.4.P 704

නඩුවේ කරුණු:

තමාගේ පෙනීම දුර්වල "M" නැමැති මහළු පුද්ගලයා ඇප පත්‍රයක් යැයි සිතා විනිමය බිලක් පිටසන් කරයි.
මෙම පිටසන් කිරීම, සිදු කිරීමේ දී "M" අතින් කිසිදු නොසැලකිලිමත් කමක්, සිදුවී නොමැති බව තහවුරු විය.
තීන්දුව:

මෙම පිටසන් කිරීමේ දී M නොසැලකිලිමත් නොවූ බැවින්, ගිවිසුමට බැඳීමක් ඇති නොවන නිසා ගිවිසුම බල රහිත වෙයි.

(b)

| ඉගෙනුම් ප්‍රතිඵල: 2.4.1 |
|---|
| පිටු අංක: 68 |

දෙන ලද සංසිද්ධියේ දී සිවිල් කලකෝලාහල තත්ත්වයක් යටතේ උත්සව ශාලාවට හානි සිදුවීම නිසා, එම සාදය (event) නොපවත්වන ලදී.

මෙම සිදුවීම (කලකෝලාහල තත්ත්වය) ගිවිසුමේ පාර්ශ්වයන්ගේ පාලනයෙන් බැහැර වූවකි. තවද මෙම සිදුවීම පාර්ශ්වයන්ගේ වරදකින් තොරව සිදු වූවකි.

ඉහත කරුණු ඉදිරිපත් කිරීම ගිවිසුම් නීතිය යටතේ, ගිවිසුම ව්‍යවර්ථවීමක් ලෙස සැලකේ. එම නිසා දෙනලද සංසිද්ධියට අනුව, උත්සව ශාලාව සම්බන්ධයෙන් වූ ගිවිසුම ව්‍යවර්ථ වූ ලෙස සැලකේ.

ගිවිසුම් නීතියට අනුව, "ගිවිසුමක් ව්‍යවර්ථ" වන විටක දී එම ගිවිසුම නිදහස් කළ හැක.

දෙන ලද සංසිද්ධියට අනුව, ගිවිසුම "ව්‍යවර්ථවීම" හේතුවෙන්, පාර්ශ්වයන් ගිවිසුම යටතේ, තිබූ බැඳීම් වලින්, නිදහස් වේ.

දෙන ලද සංසිද්ධියට සමාන කරුණු පහත නඩුවේ දී සාකච්ඡා කරන ලදී.
ටේලර් එදිරිව කැඩ්වෙල්

Taylor v Caldwell (1983) 122 ER 309

නඩුවේ කරුණු:

T,C ගෙන් සංගීත ශාලාවක් කුලියට ගත්තේය. එහෙත් පළමු වන රංග දැක්වීමට පෙර, ශාලාව ගින්නෙන් දැවී විනාශ විය. මෙම කාලය වන විට, රඟ දැක්වීම  සූදානම් කිරීම සඳහා T යම් යම් වියදම් දරා තිබුණි. ඔහු මෙම වියදම් මත සිදු වූ හානිය සඳහා වන්දි ඉල්ලා සිටියේය.

තීන්දුව:

ශාලාව විනාශ වූයේ, ගිවිසුමේ පාර්ශ්වකරුවන් දෙදෙනාගෙන්, කුමන හෝ පාර්ශ්වකරුවකුගේ වරදකින් නිසා නොවේ. එම නිසා පාර්ශ්වකරුවන් ගිවිසුම යටතේ, තිබූ බැඳීම් වලින් නිදහස් වේ. එයට හේතුව ගිවිසුම ව්‍යවර්ථවීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස සිදු වූ හානි වලට, C ගෙන් වන්දි ඉල්ලීමට  T  ට හිමිකමක් නැත.

[මුළු ලකුණු 10]

NOT FOR SALE

පිළිතුර **04**

(a)

| ඉගෙනුම් ප්‍රතිඵල: 3.3.1 |
|---|
| පිටු අංක: 90 |

දෙන ලද සංසිද්ධියට සමාන කරුණු පහත සඳහන් නඩුවේ දී සාකච්ඡා කරන ලදී.

නඩුවේ නම:

ඩෙනන්ට් එදිරිව ස්කිනර්.
(Dennant v Skinner (1948) 2 K.B. 164

නඩුවේ කරුණු:

ඩෙනන්ට් (D) මෝටර් රථයක් වෙන්දේසියේ විකුණයි. වාහනය "K" ට තීන්දු කල අතර, චෙක්පත නිශ්කාශනය වන තෙක්, වාහනයේ අයිතිය, "K" ට හිමි නොවන බවට,ගිවිසුමක් අත්සන් කිරීමෙන් පසු, වෙන්දේසියේ තීරණය වූ මිලට චෙක්පතක් දී වාහනය ගෙනයාමට "K" ට ඉඩ ලැබේ. මෙම චෙක්පත අගරු විය.

තීන්දුව:

වෙන්දේසිකරු මිටිය පහත හෙලමත් සමගම භාණ්ඩයේ අයිතිය "K" ට හිමිවේ. ඒ නිසා ඉන් පසුව ඇති කරගත් එකඟතාවය වාහනය නැවත පැවරීමට "K" ට තිබෙන අයිතියට බලපෑමක් නැත.

භාණ්ඩ විකිණීමේ ආඥා පනත යටතේ වෙන්දේසියකින් භාණ්ඩ විකිණීමක දී වෙන්දේසිකරු මිටිය පහත හෙලීමෙන්, වෙන්දේසිය අවසන් බව ප්‍රකාශ කිරීමත් සමගම, වෙන්දේසිය මගින් විකිණීම සම්පූර්ණ වේ. මෙහි අදහස, වෙන්දේසියේ විකිණීමක දී, භාණ්ඩයේ හිමිකම, ගැණුම්කරුට මාරුවීම මිටිය පහත හෙලීම මගින් සිදුවන බවයි.

එම නිසා ඉහත කී න්‍යාය සහ නඩු නීතිය අනුව, මිටිය පහත හෙලීමත් සමගම බෝට්ටුවේ හිමිකම ටොම්ට (T) මාරු වේ. T ගිවිසුම අත්සන් තබන අවස්ථාවේ දී සහ ඊට ඇතුලත් වන අවස්ථාවේ දී, බෝට්ටුවේ හිමිකම, හෝ අයිතිය ඔහුට මාරු වී ඇත. (මිටිය පහත හෙලන විට) එම නිසා හිමිකම පැවරීම සම්බන්ධයෙන්, මෙම ගිවිසුමේ බලපෑමක් නොමැත. එම නිසා බෝට්ටුවේ හිමිකම තවමත් J ට ඇතැයි සිතා කල හිමිකම් පෑම වැරදිය.

NOT FOR SALE

(b)

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 5.2.1 |
| පිටු අංක: පිටු 123 |

දෙන ලද සංසිද්ධියේ දී, "S" කළමනාකාර අධ්‍යක්ෂ (MD) වශයෙන්, කටයුතු කිරීමේ දී, අධ්‍යක්ෂ මණ්ඩලය නිහඬතාවය පළ කිරීම තුලින් ඇයට කළමනාකාර අධ්‍යක්ෂ (MD) ලෙස ක්‍රියා කිරීමට බලය, ලබාදීමක් මෙම අවස්ථාවේ දී සිදුකර ඇත. වෙනත් වචන වලින් කියන්නේ නම්, "S" SPL හි කළමනාකාර අධ්‍යක්ෂ (MD) ලෙස කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය මෙම අවස්ථාවේ දී ව්‍යංගයෙන් ඉඩ ලබා දී ඇත.

කළමනාකාර අධ්‍යක්ෂ සමාගමේ නියෝජිතයා වන විටකදී, "S" හා SPL අතර, නියෝජිතයා ප්‍රධානියා අතර සම්බන්ධතාවය ඇතිවේ.

නියෝජ්‍යාත්ව නීතිය යටතේ, නියෝජිතයා ප්‍රධානියා වෙනුවෙන්, ඇතුලත් වන ගිවිසුමක දී නියෝජිතයාට, ප්‍රධානියා එම ගිවිසුමෙන් බැඳ තැබීමට හැකිය. (ලකුණු 1)

එම නිසා මෙම අවස්ථාවේදී "S" විසින් "T" සමග ඇතුලත් වන ලද ගිවිසුම වලංගු වන අතර, SPL එම ගිවිසුමෙන් බැඳේ.

සමාන කරුණු පහත සඳහන් නඩුවේ දී සාකච්ඡා කරන ලදී.

නඩුවේ නම:

හෙලි හචින්සන් එදිරිව බ්‍රේහෙඩ් ලිමිටඩ්
(Hely - Hutchinson v Brayhead Ltd (1968) Q.B 549

නඩුවේ කරුණු:

කළමනාකාර අධ්‍යක්ෂ තනතුර බාරගත් අධ්‍යක්ෂ මණ්ඩලයක, සභාපතිවරයෙක් වෙනත් සමාගමක් වන්දි පූර්ණය කිරීම සඳහා සමාගම වෙනුවෙන්, ගිවිසුමකට එළඹ ඇත.

තීන්දුව:

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සභාපතිවරයාට කළමනාකාර අධ්‍යක්ෂ වශයෙන්, ක්‍රියාකිරීමට ඉඩදීමෙන්, ඔහුට ව්‍යංග ලෙස මෙම ගිවිසුමට ඇතුලත් වීමට බලය පවරා ඇත.

(මුළු ලකුණු 10)

NOT FOR SALE

NOT FOR SALE

# නවේදනය

මෙහි ලබාදුන් පිළිතුරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් (ශ්‍රී ලංකා ව.ග.) පමණක් ලබාදෙන ලද අතර, එම පිළිතුරු ඔබ විසින් එය "එසේම˜" යන පදනම මත පිළිගත යුතු වේ.

එම පිළිතුරු "ආදර්ශ පිළිතුරු˜" ලෙස අදහස් නොකරන නමුත් ඒවා බොහෝදුරට suggested solution ලෙස දක්වේ.

පිළිතුරු වලින් ප්‍රධාන අරමුණු දෙකක් ඉටුකෙරේ. ඒවා නම්,

01. විභාග ප්‍රශ්නයකට යෝජිත විසඳුමක් සඳහා සවිස්තරාත්මක නිදසුනක් (උදාහරණයක්) සැපයීම සහ,

02. ශිෂ්‍යයන්ට විෂය පිළිබඳව තොරතුරු පර්යේෂණය කිරීම සඳහා අත්වැලක් සැපයීම සහ විෂය පිළිබඳව ඔවුන්ගේ අවබෝධය සහ අගය වර්ධනය කිරීම.

මෙම යෝජිත විසඳුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) කිසිදු ප්‍රතිඥාහාරයක් ලබා නොදෙන නිසා ඒ සම්බන්ධව කිසිඳු අගතියකට පත්වීමක් පිළිබඳව මැසිවිල්ලක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ඉදිරිපත් කිරීමට ඔබ හට හේතුවක් නොමැත. ඒ කෙසේ වෙතත් ඔබ විසින් යම් නඩුකරයක්, වන්දි ඉල්ලීමක්, පෙත්සමක්, තර්ජනය කිරීමක් හෝ බලවත් ඉල්ලීමක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ගොනුකරනු ලැබ එයින් සැලකියයුතු අන්දමේ ජයග්‍රහණයක් ලබා නොගතහොත් ඔබ විසින් එම නඩුකරයට අදාළ සම්පූර්ණ නෛතික ගාස්තු සහ වියදම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතු වේ. එනයින්ම මෙම අයිතිවාසිකම හෝ මෙහි විස්තර කෙරෙන හෝ ශ්‍රී ලංකාවේ නීතීන් යටතේ හිමි වෙනත් අයිතිවාසිකම් බලාත්මක කරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) නෛතික ක්‍රියාමාර්ගයකට යොමුවීමට සිදුවුවහොත්, ඊට අදාළ නෛතික ගාස්තු සහ වියදම්ද ඔබ විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතුවේ.

2 2013 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) මගිනි.
සියළුම හිමිකම් ඇවිරිණි.

**මෙම ලේඛණයේ කිසිම සටහනක් ප්‍රතිඋත්පාදනය කිරීම, කුමන හෝ ආකාරයකින් හෝ ක්‍රමයකින් එනම්, ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, ඡායා පිටපත් කිරීම, වාර්තාගත කිරීම හෝ වෙනත් ක්‍රමයකින් සම්ප්‍රේෂණය කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ශ්‍රී ලංකා ව.ග.) පූර්ව ලිඛිත අවසරයකින් තොරව සිදු නොකළ යුතුය.**